# 1 ශ්‍රේණිය - පරිසරය (සැප්තැම්බර්-1 සතිය )

## 12 - තේමාව - ගමන් බිමන්

දුවේ පුතේ අපි දැන් පුංචි සෙල්ලමක් කරන්නයි හදන්නේ, කැමතියි නේද? එහෙනම් මේ විදියට ඔයාලට කරන්න පුළුවන්ද කියලා බලන්න.

- ඔයාලගෙ මිදුලෙ හරි ගේ ඇතුළෙ හරි ඉඩ තියන තැනක් තෝර ගෙන කෙලින්, ටිකක් දිග ඉරක් ඇඳ ගන්න.
- දැන් ඒ රේඛාව දිගේ සෙමින් ඇවිදින්න.
- ආයෙත් ඒ රේඛාව දිගේ වේගයෙන් ඇවිදින්න.
- ඊට පස්සෙ කකුල් ළඟින් තබමින් ඇවිදින්න.
- කකුල් ඈතින් තබමින් ඇවිදලා බලන්න.
- මෙහෙම කීපසැරයක් කරලා මෙන්න මෙහමත් ඇවිදල බලන්නකෝ.
- ඔයාලගෙ ඔලුව උඩ පොතක් තියාගෙන හෙමින් ඇවිදින්න.
- ඔයාලගෙ ඔලුව උඩ පොතක් තියාගෙන වේගයෙන් ඇවිදින්න.
- පොත් බෑගය කරේ එල්ලාගෙන ඇවිදින්න.
- පොත් බෑගය අතේ එල්ලාගෙන ඇවිදින්න.

ඔයාලට සතුටුයි නේද? මෙහෙම කීප සැරයක් ම කරල සතුටු වෙන්න ඔයාලට පුළුවන්. ගෙදර නංගී, මල්ලී, අක්කා, අයියා වුනත් එකතු කරගන්න ඔයාලට පුළුවන්.



E nanapiyasa 1 ශ්‍රේණිය පරිසරය -12 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.